# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2354/09 - 2023 ඔක්තෝබර් මස 17 වැනි අඟහරුවාදා - **2023.10.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III වැනි කොටස - ඉඩම්

### ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : නුඑ/3/1/8/අත්පත්/163.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/4/2014/එල්ඕ/358.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත සඳහන් ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔය පළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, 534 ජී පාර්ක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කඳපොළ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක 330176 හා 2023.05.15 දිනැති කැඩැස්තර සිතියමේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ල :

**01. කැබලි අංක 01**
ඉඩමේ නම: පාර්ක් වත්ත; විස්තරය : පතන; මුල් හිමිකම් කියන අය : සීමාසහිත උඩුපුස්සැල්ලාව වැවිලි සමාගම; ප්‍රමාණය : හෙක්ටයාර් 0.4047

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 නොවැම්බර් මස 15 වැනි දින පෙ.ව. 10.00ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023 නොවැම්බර් මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩී. ඒ. පී. දනන්සූරිය**,**
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0172

1A - G 040538 – 34 (2023/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2015/HW/82.
*මගේ අංකය* : DSWA/LND/4/ACQUI/FI/35.

අංක 2260/44 හා 2021.12.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1ඒ පිටුවේ පළ කරන ලද, දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 570, රදනිආර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, රදනිආර ගමේ අ.ග.පි. 215 හි පිහිටි ඉඩම හා 2ඒ පිටුවේ පළ කරන ලද අංක 569, අගලබඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බූවැල්ලගොඩ ගමේ අ.ග.පි. 156 හි පිහිටි ඉඩම අත්කර ගැනීමට අදාළව පළ කරන ලද දැන්වීම අවලංගු කරන ලද අතර, නව වන්දි පරීක්ෂණ ස්ථානය, දිනය හා වේලාව වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී 2023 දෙසැම්බර් මස 18 දින පෙ.ව. 10.00 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

අයි. ආර්. කේ. විතාරණ**,**
ප්‍රාදේශීය ලේකම්,
වලස්මුල්ල.

2023 මැයි මස 15 වැනි දින,
වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0173

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.